ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| | | |
|---|---|---|
| 13 ශ්‍රේණිය | 25A S I ඉන්දීය ඉතිහාසය | කාලය : පැය එකයි<br>Time : one hour |

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්

මෙම ප්‍රශ්න පත්‍රය 1 හා 11 ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.

**1 කොටස** 1-40 දක්වා ප්‍රශ්න **සියල්ලටම මෙම පත්‍රයේම ලබා දී ඇති උපදෙස්** පරිදි පිළිතුරු සපයන්න.

1 කොටසෙහි නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.

කොටස් **දෙකටම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු 1 කොටස 11 කොටසේ පිළිතුරු පත්‍ර සමග **අමුණා භාර දෙන්න.**

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

1 1 කිරතාර් 2 සත්පුර 3 හින්දුකුෂ්
4 බෝලාන් 5 වින්ද්‍යා ( )

2 1 අජිතකේශකම්බල 2 පූර්ණකාශ්‍යප 3 අශ්වඝෝෂ
4 මක්ඛලී ඝෝෂාල 5 නිගණ්ඨනාථපුත්ත ( )

3 1 තාම්‍රලිප්ති 2 කල්‍යාණි 3 පාටලිපුත්‍ර
4 සුප්පාරක 5 භාරුකච්ඡ ( )

4 1 වික්‍රමශිලා 2 නාලන්දා 3 තංජෝර්
4 ජගද්දලා 5 ඕදන්තපුරි ( )

5 1 හර්යංක 2 නන්ද 3 මෞර්ය
4 කුෂාණ 5 සිසුනාග ( )

6 1 චන්හුදාරෝ 2 මොහෙන්ජොදාරෝ 3 දබාරකෝත්
4 හරප්පා 5 කල්‍යාණි ( )

7 1 ශකුන්තලය 2 ප්‍රියදර්ශිකා 3 රඝුවංශය
4 මේඝදූත 5 ඍතුසංහාර ( )

8 1 භරත 2 අලීන 3 පුරු
4 යදු 5 පක්ෂ ( )

9 1 මගධ 2 කෝසල 3 මල්ල
4 වත්ස 5 අංග ( )

10 1 වලනාඩු 2 නාඩු 3 මණ්ඩලම්
4 කුර්රම් 5 කුණාල ( )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැළපෙන පද යුගලය හඳුනාගෙන ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

11 1 ශාක්‍ය - කපිලවස්තු
2 බුලිය - පිප්ඵලීවනය
3 භග්ග - සුංසුමාරගිරි
4 කෝලිය - රාමගාම
5 කාලාම - කේශපුත්ත ( )

12 1 කාවේරි - නිල්ගිරි
2 නර්මදා - වින්ද්‍යා
3 තුංගබද්‍රා - බටහිර ඝාට්ස්
4 තප්ති - සත්පුර
5 රාවි - ආරවල්ලි ( )

13 1 බදාමියේ විෂ්ණු දේවාලය - චාලුක්‍ය
2 බෙලූර්හි චෙන්නකේශ්වර දේවාලය - හොයිසාල
3 තන්ජෝරයේ බෘහදේශ්වර දේවාලය - සාතවාහන
4 මහාබලිපුරම් හි පංචරථ දේවාලය - පල්ලව
5 එල්ලෝරාහි කයිලාසනාථ දේවාලය - රාෂ්ට්‍රකූට ( )

14 1 ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලිය
2 පුරුෂපුරය - පාඨලිපුත්‍රය
3 ප්‍රයාග - අලහබාද්
4 සාගල - සියල්කෝට්
5 සෞරාෂ්ට්‍ර - කතියවාර් ( )

15 1 මෙගස්තීනීස් - පර්සියානු යුද්ධය
2 කෞටිල්‍ය - අර්ථශාස්ත්‍රය
3 බිල්හන - වික්‍රමාංකදේව චරිත
4 කල්හන - රාජතරංගනී
5 හර්ෂවර්ධන - ප්‍රියදර්ශිකා ( )

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තිරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දිනවකවානු X තිරුවේ දි ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. .Y තිරුව X තීරුව සමග ගැලපෙන අනුපිළිවෙල සකස් කළ විට පහත දි ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16

| X | Y |
|---|---|
| 1 චතුර් ආශ්‍රම | A සාම, දාන, භේද, දණ්ඩ |
| 2 චතුර්වේදය | B බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර |
| 3 චතුර් වර්ණය | C ඍග්, යජුර්, සාම අථර්වන් |
| 4 චතුර් උපායමාර්ග | D දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග |
| 5 චතුර් සත්‍ය | E බ්‍රාහ්මචාරි, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්න්‍යාසි |

1 ABDCE 2 BCDAE 3 CABDE 4 CDBAE 5 EDBAC ( )

17

| X | Y |
|---|---|
| 1 කෝසල දේවි | A ප්‍රසේනජිත් |
| 2 මල්ලිකා දේවි | B බිම්බිසාර |
| 3 වීදිසා දේවි | C ග්‍රහවර්මන් |
| 4 රාජ ශ්‍රී | D අජාසත්ත |
| 5 වජිරා | E අශෝක |

1 ABECD 2 BAEDC 3 BAECD 4 CABED 5 DAEBC ( )

18

| X | Y |
|---|---|
| 1 ක්‍රි.ව. 78 | A අශෝක රජවීම |
| 2 ක්‍රි.පූ. 269 | B හර්ෂවර්ධන රජවීම |
| 3 ක්‍රි.පූ. 327 | C 1 වන රාජේන්ද්‍රචෝළ රජවීම |
| 4 ක්‍රි.ව. 606 | D කණිෂ්ක රජවීම |
| 5 ක්‍රි.ව. 1016 | E ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණය |

1 DACBE 2 BECAD 3 DAEBC 4 DABEC 5 CABEC ( )

19

| X | Y |
|---|---|
| 1 නාසික් සෙල්ලිපිය | A ගෞතමී බාලශ්‍රී |
| 2 හතිගුම්පා සෙල්ලිපිය | B රුද්‍රදාමන් |
| 3 අයිහෝල් සෙල්ලිපිය | C සමුද්‍රගුප්ත |
| 4 ජුනාගාඩ් සෙල්ලිපිය | D දෙවන පුලකේෂින් |
| 5 අලහාබාද් සෙල්ලිපිය | E ඛාරවේල |

1 ADCBE 2 BEDCA 3 AEDBC 4 ADEBC 5 CABDE ( )

20

| X | Y |
|---|---|
| 1 ඩිමෙට්‍රියස් | A ඉන්දු-ග්‍රීක |
| 2 නහපාන | B හූණ |
| 3 සීමුක | C සාතවාහන |
| 4 තෝරමාන | D ශක |
| 5 දන්තිදුර්ග | E රාෂ්ට්‍රකූට |

1 ADCBE 2 BEDCA 3 CAEDB 4 DBAEC 5 ECBAD ( )

- අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාල මාතෘකාවට නොගැලපේ. එම නොගැලපෙන කරුණ තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.

21 දෙවන චන්ද්‍රගුප්ත රජු

1 ඔහු ස්කන්ධගුප්ත රජුගේ පුත්‍රයාය.

2 ගුජරාටය, සෞරාෂ්ට්‍රය සහ මාල්වා යටත් කර ගනිමින් ඔහු ගුප්ත අධිරාජ්‍යය පුළුල් කළේය.

3 චීන සංචාරක භික්ෂුවක් වූ ෆාහියන් ඔහුගේ රාජ්‍යසමයේදී අවුරුදු කිහිපයක් ඉන්දියාවේ ගත කළේය.

4 ඔහු තම දියණිය වූ ප්‍රභාවතී වාකාටක රාජ්‍යයේ දෙවන රුද්‍රසේන රජුට සරණපාවා දුන්නේය.

5 ශිව භක්තිකයකු වුවද ඔහු බුද්ධාගමට හා ජෛනාගමට ඉඩදෙන ලදී ( )

22 ඉන්දු නිම්න නගර සැලසුම්

1 නගර සැලසුම්කරණය හා සනීපාරක්ෂාව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.

2 වීදි හා පටු මාවත් සැලසුමකට අනුව ඉදිකොට ඇත.

3 මොහෙන්ජෝදාරෝ සහ හරප්පා නගරවල ගොඩනැගිලි ඉදිකොට ඇත්තේ පාෂාණවලිනි.

4 වීදි හා පටු මාවත් අඩි 09 සිට 34 දක්වා පළලින් යුක්තය.

5 වැදගත් ඉන්දු නිම්න නගර බලකොටුව සහ පහළ නගරය යන කොටස් දෙකකින් සමන්විත විය.

( )

23 දකුණු ඉන්දියාව

1 දකුණු ඉන්දියානු ප්‍රදේශ යටත්කොට තම රාජ්‍යයට ඈදා ගැනීමට සමත් වූ එකම උතුරේ රජු හර්ෂවර්ධනයි.

2 වින්ධ්‍යා කඳුවැටියෙන් දකුණු ප්‍රදේශය දකුණු ඉන්දියාව ලෙසට සැලකේ.

3 ක්‍රිෂ්ණා-තුංගභද්‍රා නදීවලින් උතුරු ප්‍රදේශය ඩෙකෑනය ලෙස හැඳින්වේ.

4 ක්‍රි.ව. අටවැනි සියවස මැද සිට ඩෙකෑනයේ විශාල ප්‍රදේශයක් පළමුව රාෂ්ට්‍රකූටයන් විසින්ද අනතුරුව චාලුක්‍යයන් විසින්ද පාලනය කරන ලදී.

5 පල්ලව පාණ්ඩ්‍ය හා චෝළ පාලකයෝ රාෂ්ට්‍රකූට හා චාලුක්‍යය පාලකයන්ගේ සමකාලීනයෝ වූහ.

( )

24 මෞර්ය අධිරාජ්‍යය

1 මෞර්ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා අශෝකය.

2 මෞර්ය වංශයේ ආරම්භකයා චන්ද්‍රගුප්ත මෞර්යය.

3 චන්ද්‍රගුප්තගේ අගනුවර පාටලීපුත්‍රයයි.

4 බිංදුසාරගේ අටවන රාජ්‍ය වර්ෂයේදී කාලිංගය ජය ගන්නා ලදී.

5 පුෂ්‍යමිත්‍ර සුංග විසින් ඇරඹූ කැරැල්ල නිසා මෞර්ය අධිරාජ්‍යය බිඳවැටුනි. ( )

25 පාණ්ඩ්‍යයෝ

1 පාණ්ඩ්‍යයන්ගේ අගනගරය කාංචිය විය.

2 අශෝක සෙල්ලිපිවලට අනුව එවකට පාණ්ඩ්‍යයෝ ස්වාධීන පාලකයෝ වූහ.

3 චෝළ පාලක පළමුවන පරන්තක විසින් දෙවන මාරවර්මන් රාජසිංහ පරාජයට පත් කරන ලදී.

4 පළමුවන පාණ්ඩ්‍ය අධිරාජ්‍ය පිහිටුවන ලද්දේ කඩුන්ගෝන් විසිනි.

5 ක්‍රි.ව. 1190 දී ජටාවර්මන් කුලසේකර පාණ්ඩ්‍ය සිංහාසනයට පැමිණීම දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ආරම්භය ලෙස සැලකේ. ( )

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති ( A ), ( B ),( C ) සහ ( D ) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවරදිය. නිවරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තොරන්න.

  ( A ) සහ ( B ) පමණක් නිවරදි නම්.............. 1 ද

  ( A ) සහ ( C ) පමණක් නිවරදි නම්................ 2 ද

  ( B ) සහ ( C ) පමණක් නිවරදි නම් ........... 3 ද

  ( C ) සහ ( D ) පමණක් නිවරදි නම්.............. 4 ද

  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවරදි නම්................. 5 ද වරහන් තුළ යොදන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය | A සහ C පමණක් නිවැරදිය | B සහ C පමණක් නිවැරදිය | C සහ D පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය |

26 සමුද්‍රගුප්ත

A සිහසුනට පත් වු වහාම දක්ෂිණාපථයේ රාජධානි 12ක් සමුද්‍රගුප්ත අත්පත් කර ගත්තේය.

B මෙසේ අල්ලාගත් දක්ෂිණාපථයේ රාජධානි සමුද්‍රගුප්ත සිය අධිරාජ්‍යයට සෘජුවම ඈදා ගත්තේය.

C සමුද්‍රගුප්තගේ යුධ ව්‍යාපාරය ශිර්ෂ හතරක් යටතේ අලහාබාද් ප්‍රශස්තියේ විස්තර කර තිබේ.

D ශ්‍රී ලංකාවේ රජු සමුද්‍රගුප්ත රජුට අවනතභාවය දැක්වූ පාලකයින් අතුරෙන් කෙනෙකි. ( )

27 සෘග්වෛදික යුගය

A කුරු හා පංචාල මෙකල පැවති බලවත් ගෝත්‍ර විය.

B සෘග් වෛදික යුගයේ ජනයා දකුණු ඉන්දියාවේ පවා පදිංචිව සිටියහ.

C මෙම අවධියේ ජනයා ගෝත්‍ර සමුහයකට බෙදී සිටියහ.

D මෙම ජනයා ස්වභාව ධර්මය හා සම්බන්ධව බොහෝ දෙවිවරු වන්දනා කල හ. ( )

28 පල්ලවයෝ

A සාතවාහන රාජ්‍යයෙන් පසුව පල්ලවයන් ඩෙකෑනයේ බලයට පත්වන ලදී.

B පල්ලවයන් හා චාලුක්‍යයන් අතර ගැටුම් ආරම්භ වුයේ පළමුවන මහේන්ද්‍රවර්මන් රාජ සමයේදීය.

C පළමුවන නරසිංහ වර්මන් චාලුක්‍ය පාලක දෙවන පුලකේෂින් පරදා මරා දැම්මේය.

D දෙවන පුලකේෂින්ගේ මරණින් පසුව චාලුක්‍ය අගනුවර වු වාතාපිය පල්ලව රාජධානියේ ප්‍රාදේශිය පරිපාලන මධ්‍යස්ථානයක් බවට පත්විය. ( )

29 රුද්‍රදාමන්

A රුද්‍රදාමන් උජ්ජේයිහි මහා ක්ෂත්‍රප විය.

B සුදර්ශන ජලාශයේ වැව් බැම්ම කැඩීයාමෙන් පසුව එය නැවත ගොඩනැගීම ගැන ජුනාගාත් ලිපියෙහි දක්වා ඇත.

C රුද්‍රදාමන් උජ්ජේයිනියෙහි ශක පාලනයේ ආරම්භකයාය.

D ඔහු යුද්ධයෙන් පරදවාලීමට ගෞතමිපුත්‍ර සාතකර්ණි සමත් විය. ( )

30 කාලිදාස

A කාලිදාස දක්ෂිණපථයේ උපත ලැබුවෙකි.

B කාලිදාස 11 චන්ද්‍රගුප්ත රාජ සභාවේ සිටි කවීන් නව දෙනාගෙන් කෙනෙකි.

C කුමාරසම්භවය කාලිදාස විසින් රචිත මහා කාව්‍යයක් ලෙසට සැලකේ.

D වික්‍රමෝර්වෂී නාට්‍ය සමුද්‍රගුප්ත රජුගේ ජීවිතය හා සම්බන්ධව රචනා වී ඇත. ( )

- අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

31 ශකවරු ඉන්දියාවට පැමිණියේ කුමන දුර්ග මාර්ගය හරහාද?

1 බෝලාන්දුර්ගය　2 ඛයිබර් දුර්ගය　3 මක්රාන් දුර්ගය

4 බැරෝඩා දුර්ගය　5 හේරාට් දුර්ගය ( )

32 ඛරෝෂ්ඨී අක්ෂරයෙන් ලියැවුණු අසෝක සෙල්ලිපිය කවරේද?

1 රුම්මින්දෙයි　2 ශාබාස්ගර්හි　3 ධෞලි

4 බරාබර්　5 ගිර්තාර් ( )

33 වාකාටක රාජ්‍ය පාලනය කළ ගුප්ත කුමාරිකාව කවුද?

1 ධ්‍රැව දේවි　2 කුාවිරනාගා　3 ප්‍රභාවතී ගුප්තා

4 දත්ත දේවි　5 කුමාරි දේවි ( )

34 “මදුරෙයි කොණ්ඩෙයි” විරුදය ලත් චෝළ පලකයා නම් කරන්න.

1 පළමුවන රාජරාජ　2 පළමුවන පරන්තක　3 පළමුවන රාජේන්ද්‍ර

4 විජයාලය　5 පළමුවන ආධිත්‍ය ( )

35 විශ්මකර්ම ගුහාව පිහිටියේ කොහේද?

1 බදාමි　2 සාරානාත්　3 එල්ලෝරා

4 අජන්තා　5 මදුරෙයි ( )

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්න වලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්දයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවේ දක්වෙන 1/ 2/ 3/ 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 01 | නිවැරදිය | වැරදිය |
| 02 | නිවැරදිය | නිවැරදිය |
| 03 | වැරදිය | වැරදිය |
| 04 | වැරදිය | නිවැරදිය |
| 05 | නිවැරදිය | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36 | ඍග් වේදයට අනුව පුරන්දර දෙවියන් හරියුපියා නගරයේදී ධන ධාන්‍යයෙන් ආඪ්‍යය ලිංග පූජා පැවැත් වූ පිරිසක් විනාශ කලේය. | වෛදික ජනයාගේ යුද්ධයට අධිපති දෙවියන් ඉන්ද්‍ර යනුවෙන් හැඳින්වේ. | ( ) |
| 37 | මෙගස්තීනීස් වනාහි මෞර්ය රාජ සභාවේ සිටි සෙලියුකස් නිකේටර්ගේ තනාපතිවරයාය. | පාටලිපුත්‍රය නගරයේ පාලනය කොමසාරිස් මණ්ඩල පහක් විසින් සිදු කරන ලද බව මෙගස්තිනීස් වාර්තා කරයි. | ( ) |
| 38 | අංගුත්තර නිකායට අනුව ක්‍රි.පූ. 6 සියවසේදී ඉන්දියාවේ මහා ජනපද දහයක් විය. | ජනපද දහසය අතුරෙන් ප්‍රධාන රාජාණ්ඩුව වූයේ වජ්ජි රාජ්‍යයයි. | ( ) |
| 39 | තංජෝරය පාණ්ඩ්‍යයන්ගේ අගනගරය විය. | ශ්‍රී ලංකාවේ රාජ කුමාරයෙකු වූ මානවයම්ම කුමරු සාතවාහන පාලක නරසිංහ වර්මන් යටතේ සේවය කොට උපකාරක හමුදාවක් රැගෙන ලංකාවට පැමිණෙණ ලදී. | ( ) |
| 40 | දකුණු ඉන්දියාවේ විශාලතම හින්දු දේවාලය තංජෝර්හි බෘහදේශ්වර දේවාලයයි. | එහි පවත්නා නටරාජා පිළිරුව පැරණිතම ඉන්දියානු ප්‍රතිමාව බව සැලකේ. | ( ) |

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 25A | S | II | ඉන්දීය ඉතිහාසය | කාලය : පැය දෙකයි<br>Time : 2 hours |
|---|---|---|---|---|---|

ඉන්දියාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා.

උපදෙස්

පිළිතුරු සැපයීය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.

11 ප්‍රශ්න පත්‍රය A,B,C යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

A කොටස පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.

## A කොටස

01 ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

1 ඛයිබර් දුර්ගය
2 නර්මදා නදිය
3 තංජෝරය
4 වින්ද්‍යා කඳුවැටිය
5 කනෞජය
6 කාලිංගය
7 ජුනාගාද්
8 මදුරාපුරය
9 සැවැත්නුවර
10 පාටලීපුත්‍රය
11 ගෝධාවරී නදිය
12 තාම්‍රලිප්ති

## B කොටස

02 ඉන්දියානු ඉතිහාසය හැඩගැසීමේලා වයඹ කපොලු බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න (ලකුණු 16 යි)

03 ඍග් වෛදික යුගයේ සමාජ ආර්ථික තත්ත්වයන්හි ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)

04 හරප්පා වැසියන්ගේ ආගමික විශ්වාස හා ඇදහිලිවල මුඛ්‍ය ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

05 පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I සොළොස්මහ ජනපද

II අශෝක රජුගේ ධර්ම විජය ප්‍රතිපත්තිය හා සමාජ සුභසාධනය

III කණිෂ්ක රජතුමා

IV ඉන්දු-ග්‍රීකයෝ (ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

06 ගුප්ත අධිරාජ්‍යය පිරිහීමට හා බිඳවැටීමට බලපෑ ප්‍රධාන සාධක කවරේද? (ලකුණු 16 යි)

07 හර්ෂවර්ධන දක්ෂ සටන්කාමියෙකු මෙන්ම හොඳ පරිපාලකයෙක් ද විය. මෙම රාජ්‍ය සමයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 16 යි)

08 I රාජ රාජ සහ රාජේන්ද්‍ර චෝළ අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සඳහා දැක්වූ දායකත්වය විමර්ෂණය කරන්න. (ලකුණු 16 යි)

09 පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.


I ත්‍රිකෝණික අරගලය

II පාල රාජවංශය

III සාතවාහන සංස්කෘතිය

IV පාණ්ඩ්‍ය රාජ්‍යය (ලකුණු 08 × 2 = 16 යි)


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!




(10) WWW.PastPapers.WiKi (10)





Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!